// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2258/18 - 2021 දෙසැම්බර් මස 14 වැනි අඟහරුවාදා - 2021.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

**හයවන උපලේඛනයේ 10 වන පරිච්ඡේදය යටතේ වන නිවේදනය**

2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කර ඇති පරිදි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (මින් මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) හයවන උපලේඛනයේ 10 වන ඡේදයෙහි උපඡේද (2) හි (ඇ) හා (ඉ) අයිතම මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, හේරත් මුදියන්සේලාගේ විජය චන්ද්‍රතිලක බණ්ඩාර වන මම, මෙම නිවේදනය මගින්, හයවන උපලේඛනයේ 10 වන ඡේදයෙහි උපඡේද (2) හි අයිතම (ඇ) හි කාර්යයන් සඳහා භාණ්ඩ හා සේවා සඳහා දේශීය එකතු කළ අගය ගණනය කිරීමේ පදනම මෙහි 1 වන උපලේඛනයේ සහ හයවන උපලේඛනයේ 10 වන ඡේදයෙහි උපඡේද (2) හි අයිතම (ඉ) හි කාර්යයන් සඳහා වාර්තා, මූලාශ්‍ර ලියවිලි හා ආශ්‍රිත ලියවිලි පවත්වාගෙන යාම පිළිබඳ අවශ්‍යතා මෙහි 2 වන උපලේඛනයේ නිශ්චිතව දක්වමි.

**හේරත් මුදියන්සේලාගේ විජය චන්ද්‍රතිලක බණ්ඩාර,**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02,
2021 දෙසැම්බර් මස 13 වැනි දින දී ය.

## 1 වන උපලේඛනය

1. **භාණ්ඩ විකුණනු ලබන තැනැත්තකු, පහත දැක්වෙන පරිදි දේශීය එකතු කළ අගය ගණනය කළ යුතුය.**

**(අ) ශ්‍රී ලංකාවේ දී භාණ්ඩ නිෂ්පාදනය කර විකුණනු ලබන තැනැත්තකු**

(i) මෙම උපඡේදයේ අයිතම (ii) (iii) හා (iv) හි සඳහන් කොන්දේසිවලට යටත්ව, එම තැනැත්තා විසින් ආසන්නතම පූර්ව තක්සේරු වර්ෂයේ සත්‍ය ප්‍රමාණ භාවිතා කරමින් පහත දැක්වෙන සූත්‍රය මත පදනම්ව, යම් තක්සේරු වර්ෂයක් සඳහා දේශීය එකතු කළ අගය ගණනය කිරීම අවශ්‍ය වේ.

පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (2) හි අයිතම (ඇ) හි කාර්යයන් සඳහා සලකා බලනු ලබන තක්සේරු වර්ෂයක, ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කළ භාණ්ඩයක් සඳහා වන දේශීය එකතු කළ අගය මත ප්‍රතිශතය $= \frac{\mathbf{E \times 100}}{\mathbf{A}}$

මෙහි

| | |
|---|---|
| **'E'** | **A - (B+C+D)** ට සමාන වේ ; |
| **'A'** | අදාල භාණ්ඩයේ විකුණුම්වල මුළු වටිනාකම් වේ ; |
| **'B'** | එම භාණ්ඩය නිෂ්පාදනය කිරීමට භාවිතා කරන ලද සෘජුවම ආනයනය කළ ද්‍රව්‍යවල මුළු පිරිවැය ; |
| **'C'** | ආනයනය කරන ලද දේශීය සැපයුම්කරුවාගෙන් මිල දී ගෙන එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමට භාවිතා කරන ලද ආනයනික ද්‍රව්‍යවල මුළු පිරිවැය ; සහ |
| **'D'** | යම් රාජ්‍ය භාග, පොලී, කළමනාකරණ ගාස්තු හෝ ප්‍රධාන කාර්යාලීය වියදම් ද ඇතුළත්ව එම භාණ්ඩ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකුට ගෙවන ලද හෝ ගෙවිය යුතු යම් සේවාවක මුළු පිරිවැය |

(ii) අයිතම (i) හි සඳහන් සූත්‍රයෙහි කාර්යයන් සඳහා, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හා ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනික ද්‍රව්‍ය ලෙස සලකනු නොලැබේ.

(iii) යම් තැනැත්තකුගේ සියළුම ව්‍යාපාර කටයුතු සඳහා පොදුවේ යම් සේවාවක් හෝ ද්‍රව්‍යයක් භාවිතා කරන්නේ නම්, ඉහත ගණනය කිරීමේ කාර්යය සඳහා එම මුළු සේවා පිරිවැය හෝ මුළු ද්‍රව්‍ය පිරිවැය, අදාළ භාණ්ඩයේ හෝ සේවාවේ පිරිවැටුම මත පදනම්ව බෙදනු ලැබිය යුතුය.

(iv) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි විධිවිධාන ප්‍රකාරව, එකතු කළ අගය මත නිමවුම් බදු ලෙස අය කළ හෝ යෙදවුම් බදු ලෙස අඩු කළ ප්‍රමාණ, ඉහත ගණනය කිරීම සඳහා සලකනු නොලැබේ.

**(ආ)** උපඡේද (අ) යටතේ ගණනය කරන ලද දේශීය එකතු කළ අගය 65% ට වඩා අඩු වන්නේ නම් හෝ ආසන්නතම පූර්ව තක්සේරු වර්ෂය තුළ දී එම තැනැත්තා විසින් අදාල භාණ්ඩය නිෂ්පාදනය කර නොමැති නම් හෝ, ඉහත උපඡේද (අ) යටතේ වන සූත්‍රය මත පදනම්ව, එම භාණ්ඩය සම්බන්ධයෙන් පවත්නා තක්සේරු වර්ෂයේ ප්‍රමාණ භාවිතා කරමින් එම භාණ්ඩය සඳහා දේශීය එකතු කළ අගය ගණනය කිරීමට එම තැනැත්තාට ඉඩ දෙනු ලබන අතර පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (2) හි අයිතම (ඇ) හි කාර්යයන් සඳහා එම එකතු කළ අගය ගණනය කිරීම, බල පැවැත්වේ.

කෙසේ වෙතත්, ඉහත (අ) උපඡේදය යටතේ දේශීය එකතු කළ අගය ගණනය කරන ලද සහ පෙර යම් තක්සේරු වර්ෂයක් සඳහා අදාල කරගත් භාණ්ඩයක් සම්බන්ධයෙන් මෙම උපඡේදය අදාළ නොවේ.

**(ඇ) වෙනත් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන ලද යම් භාණ්ඩයක් විකුණනු ලබන තැනැත්තකු**

එම තැනැත්තා අදාළ භාණ්ඩය සඳහා අලෙවිකරණ හා සන්නිවේදන කටයුතු භාර ගන්නේ නම්, පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (2) හි අයිතම (ඇ) හි කාර්යය සඳහා, ඉහත උපඡේද (අ) හා (ආ) පරිදි ගණනය කරන ලද දේශීය එකතු කළ අගය මත ප්‍රතිශතය සහිතව නිෂ්පාදකයාගෙන් තහවුරු කිරීමක් ලබා ගත යුතුය. එම තහවුරු කිරීම, අදාළ භාණ්ඩය නිෂ්පාදනය කරනු ලබන තැනැත්තකු හා එම භාණ්ඩය විකුණන තැනැත්තකු විසින් බදු නිලධාරියෙකුට කරනු ලබන ප්‍රකාශයක් ලෙස සැලකිය යුතුය.

එසේ වුව ද, මෙම උපඡේදය යටතේ වෙනත් තැනැත්තකුට යම් තහවුරු කිරීමක් ලබා දෙනු ලබන තැනැත්තකු, තම භාණ්ඩයේ දේශීය එකතු කළ අගය ගණනය කිරීම සම්බන්ධයෙන් වාර්තා පවත්වා ගෙන යා යුතුය.

2. **සේවාවන් (භාණ්ඩ සමග මිශ්‍ර හා සංයුක්ත සේවාවන්ද ඇතුළුව) සපයනු ලබන තැනැත්තකු විසින් දේශීය එකතු කළ අගය පහත සඳහන් පරිදි ගණනය කළ යුතු ය.**

**(අ) භාණ්ඩ සමග මිශ්‍ර හා සංයුක්ත සේවාවන් ද ඇතුළුව සේවාවන් සපයනු ලබන තැනැත්තකු**

(i) මෙම උපඡේදයේ අයිතම (ii) (iii) (iv) සහ (v) හි සඳහන් කොන්දේසිවලට යටත්ව, එම තැනැත්තා විසින් ආසන්නතම පූර්ව තක්සේරු වර්ෂයේ සත්‍ය ප්‍රමාණ භාවිතා කරමින් පහත දැක්වෙන සූත්‍රය මත පදනම්ව, යම් තක්සේරු වර්ෂයක් සඳහා දේශීය එකතු කළ අගය ගණනය කිරීම අවශ්‍ය වේ.

පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (2) හි අයිතම (ඇ) හි කාර්යයන් සඳහා සලකා බලනු ලබන තක්සේරු වර්ෂයක, සපයන ලද සේවාවන් සඳහා වන දේශීය එකතු කළ අගය මත ප්‍රතිශතය $= \frac{E \times 100}{A}$

මෙහි

| | |
|---|---|
| **'E'** | **A - (B+C+D)** ට සමාන වේ ; |
| **'A'** | අදාල සේවාවේ මුළු දළ සේවා ආදායම වේ ; |
| **'B'** | එම සේවාව සඳහා භාවිතා කරන ලද සෘජුවම ආනයනය කළ ද්‍රව්‍ය ඇත්නම් එම මුළු පිරිවැය ; |
| **'C'** | ආනයනය කරන ලද දේශීය සැපයුම්කරුවාගෙන් මිල දී ගෙන එම සේවාව සඳහා භාවිතා කරන ලද ආනයනික ද්‍රව්‍ය ඇත්නම් එම ද්‍රව්‍යවල මුළු පිරිවැය වේ; සහ |
| **'D'** | යම් රාජ්‍ය භාග, පොළී, කළමනාකරණ ගාස්තු හෝ ප්‍රධාන කාර්යාලීය වියදම් ඇතුළත්ව එම සේවා ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකුට ගෙවන ලද හෝ ගෙවිය යුතු යම් සේවාවක මුළු පිරිවැය වේ. |

(ii) අයිතම (i) හි සඳහන් සූත්‍රයෙහි කාර්යයන් සඳහා, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් හා ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනික ද්‍රව්‍ය ලෙස නොසලකනු ලැබේ.

(iii) යම් තැනැත්තකුගේ සියළුම ව්‍යාපාර කටයුතු සඳහා පොදුවේ යම් සේවාවක් හෝ ද්‍රව්‍යයක් භාවිතා කරන්නේ නම්, ඉහත ගණනය කිරීමේ කාර්යය සඳහා එම මුළු සේවා පිරිවැය හෝ මුළු ද්‍රව්‍ය පිරිවැය,අදාළ භාණ්ඩයේ හෝ සේවාවේ පිරිවැටුම මත පදනම්ව බෙදනු ලැබිය යුතුය.

(iv) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි විධිවිධාන ප්‍රකාරව, එකතු කළ අගය මත නිමවුම් බදු ලෙස අය කළ හෝ යෙදවුම් බදු ලෙස අඩු කළ ප්‍රමාණ, ඉහත ගණනය කිරීම සඳහා සලකනු නොලැබේ.

(v) යම් තැනැත්තකු විසින් විවිධ සේවාවන් සපයන විට, එක් එක් සේවාව සඳහා එම තැනැත්තා දරන ලද අලෙවිකරණ හා සන්නිවේදන වියදම වෙන වෙනම හඳුනා ගත හැකි නම්, එවිට, එම තැනැත්තා එක් එක් අදාළ සේවාව සඳහා වෙන් වෙන්ව ගණනය කිරීම් සිදු කළ යුතුය.

**(ආ)** උපඡේද (අ) යටතේ ගණනය කරන ලද දේශීය එකතු කළ අගය 65% ට වඩා අඩු වන්නේ නම් හෝ ආසන්නතම පූර්ව තක්සේරු වර්ෂය තුළ දී එම තැනැත්තා විසින් අදාළ සේවාව සපයා නොමැති නම්, ඉහත උපඡේද (අ) යටතේ වන සූත්‍රය මත පදනම්ව, එම සේවාව සම්බන්ධයෙන් පවත්නා තක්සේරු වර්ෂයේ ප්‍රමාණ භාවිතා කරමින් එම සේවාව සඳහා දේශීය එකතු කළ අගය ගණනය කිරීමට එම තැනැත්තාට ඉඩ දෙනු ලබන අතර පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (2) හි අයිතම (ඇ) හි කාර්යයන් සඳහා එම එකතු කළ අගය ගණනය කිරීම, බල පැවැත්වේ.

කෙසේ වෙතත්, ඉහත (අ) උපඡේදය යටතේ දේශීය එකතු කළ අගය ගණනය කරන ලද සහ පෙර යම් තක්සේරු වර්ෂයක් සඳහා අදාල කරගත් සේවාවක් සම්බන්ධයෙන් මෙම උපඡේදය අදාළ නොවේ.

## 2 වන උපලේඛනය

පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (1) හි විධිවිධාන පරිදි, අතිරේක අඩු කිරීමක් අඩු කිරීමට අපේක්ෂා කරනු ලබන තැනැත්තකු විසින් පහත දැක්වෙන ලියවිලි හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1. පහත දැක්වෙන ආකෘතියට අනුව, පනතේ 15 අ වගන්තිය යටතේ අඩු කරන ලද අලෙවිකරණ හා සන්නිවේදන වියදම් ලැයිස්තුව

| වියදම් කළ දිනය | වියදම දරන ලද භාණ්ඩයෙහි හෝ සේවාවෙහි වෙළඳ නාමය | වියදම දරන ලද භාණ්ඩය හෝ සේවාවෙහි ස්වභාවය | ඉන්වොයිස්/ බිල්පත් අංකය | ගෙවීම ලබන්නා | ලබාගත් අලෙවි හා සන්නිවේදන සේවාවේ ස්වභාවය | ගෙවූ මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

2. පහත දැක්වෙන ආකෘතියට අනුව, පනතේ හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේද (1) යටතේ අතිරේක අඩු කිරීම් සඳහා සැලකිල්ලට නොගත් (හයවන උපලේඛනයේ 10 වන ඡේදයේ උපඡේදයේ (2) හි අයිතම (අ) හා (ආ) යටතේ වූ) අලෙවිකරණ හා සන්නිවේදන වියදම් ලැයිස්තුව

| වියදම් කළ දිනය | වියදම දරන ලද භාණ්ඩයෙහි හෝ සේවාවෙහි වෙළඳ නාමය | වියදම දරන ලද භාණ්ඩය හෝ සේවාවෙහි ස්වභාවය | ඉන්වොයිස්/ බිල්පත් අංකය | ගෙවීම ලබන්නා | ලබාගත් අලෙවි හා සන්නිවේදන සේවාවේ ස්වභාවය | ගෙවූ මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

3. තක්සේරු වර්ෂය සඳහා ආශ්‍රිත තැනැත්තන්ගේ ලැයිස්තුව

4. 1 වන උපලේඛනයට අනුකූලව එක් එක් භාණ්ඩය හෝ සේවාව සම්බන්ධයෙන් දේශීය එකතු කළ අගය ගණනය කිරීමේ වැඩ පත්‍රය

5. සැපයුම්කරුගේ නම, සැපයුම්කරුගේ ලිපිනය, සැපයුම්කරුගේ බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය, සපයා ඇති සේවාවන්ගේ විස්තරාත්මක විෂය පථය, ගාස්තු හා අනෙකුත් නියමයන් හා කොන්දේසි නිශ්චිතව දැක්වමින් සෑම වියදමක්ම **ගිවිසුමක්/ කොන්ත්‍රාත්තුවක්** මගින් තහවුරු කළ යුතුය.

6. සපයන ලද සේවාව සහ එය ඉහත අයිතම 5 හි සඳහන් පරිදි ගිවිසුමට සම්බන්ධ වන ආකාරය පැහැදිලිව විස්තර කරමින් සියළුම වියදම් **අදාළ ඉන්වොයිස්/ බදු ඉන්වොයිස්** මගින් තහවුරු කළ යුතුය.

EOG 12-0139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.